අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

# හින්දි

12 සහ 13 ශ්‍රේණි

## විෂය නිර්දේශය

(2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

## 1.0 විෂය හැඳින්වීම.

හින්දී භාෂාව අපගේ අසල්වැසි රට වන ඉන්දියාවේ රාජ්‍ය භාෂාව වන අතර, උතුරු ඉන්දියාවේ විශාල භූමි ප්‍රදේශයක වෙසෙන ඉන්දියානු ජනගහනයෙන් අඩකට ආසන්න ජනතාවගේ මාතෘ භාෂාව ද වේ. මීට අමතර ව සූරිනාම්, ෆීජි, ගයානා වැනි රටවල බහුල වශයෙන් ද, ලෝකයේ වෙනත් රටවල් රාශියක ද හින්දී භාෂාව භාවිත වේ. එමෙන් ම, ලෝකයේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාල රාශියක සහ වෙනත් ආයතන රාශියක ද විදේශ භාෂාවක් ලෙස හින්දී භාෂාව ඉගෙන ගැනීමේ පාඨමාලා ඇත.

භාෂාත්මක වශයෙන් සිංහල භාෂාවට ඇති ඥාතිත්වයත්, ආගමික, සංස්කෘතික, සාහිත්‍යයික, දේශපාලනික, ආර්ථික හා සාමාජීය සම්බන්ධතාත් හේතු කොට ගෙන විදේශීය භාෂාවක් ලෙස හින්දී භාෂාව ඉගෙනීම ශ්‍රී ලාංකිකයනට අතිශයින් වැදගත් වෙයි. විශේෂයෙන් ම සංගීතය, නර්තනය, චිත්‍ර ආදි පෙරදිග කලාවන් මෙන් ම ආයුර්වේදය වැනි විෂය ක්ෂේත්‍රයන් හැදෑරීමේ දී ද හින්දී භාෂාව අත්‍යවශ්‍ය ය.

## 2.0 විෂය අරමුණු.

2.1 විදේශ භාෂාවක් ලෙස හින්දී භාෂාව කථා කිරීමේ හා ලිවීමේ හැකියාව ලැබීම.

2.2 තත් භාෂාව හා සම්බන්ධ සාහිත්‍යය රසවිඳීම සහ එම සාහිත්‍යය ස්වභාෂාවට පරිවර්තනය කර ගැනීමේ හැකියාව ලැබීම.

2.3 ඉන්දියාව හා සම්බන්ධ විශේෂ විෂය ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී සහ පර්යේෂණ කාර්යයන්හි දී හින්දී භාෂාව දැන සිටීම විශේෂ සුදුසුකමක් වීම.

## අ. පො. ස. (උසස් පෙළ) හින්දී විෂය

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 12 | I | 1.1, 1.2, 1.3, 2.1, 2.2, 2.3 | 100 |
| | II | 2.4, 2.5, 3.1, 3.2, 4.1.1 | 100 |
| | III | 4.1.2 | 100 |
| 13 | I | 4.2.1, 4.2.2, 4.2.3, 5.1, 5.2, 7.1 | 100 |
| | II | 5.3, 6.1, 6.2, 7.2, 8.1 | 100 |
| | III | 9.1, 9.2, 9.3, 9.4, 9.5, 9.6, 10.1 | 100 |

# 3. 0 අ. පො. ස. (උසස් පෙළ) හින්දි විෂය නිර්දේශය

## 12 වන ශ්‍රේණිය

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 1.0 වර්ණමාලාව නිවැරදි ව භාවිත කරයි. | 1.1 හින්දි භාෂාව හා භාෂක කලාපය හඳුනාගනියි. | • හින්දි භාෂාව හා එය අයත් භාෂක කලාපය පිළිබඳ මූලික හැඳින්වීම.<br><br>භාරතයේ භූගෝලීය පිහිටීම, ප්‍රාන්ත හා සාංගමික රාජ්‍ය, භාෂා වර්ග, භාවිත භාෂා, හින්දි භාෂක කලාපය පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීම. | 02 |
| | 1.2 හින්දි වර්ණ මාලාව නිවැරදි ව ලියයි. | • සම්මත හින්දි වර්ණමාලාව.<br><br>**සම්මත ලේඛන නීතිරීති**<br><br>මේ යටතේ ස්වර, ව්‍යඤ්ජන, අතිරේක ස්වර හා ව්‍යඤ්ජන, ව්‍යඤ්ජන සංයුක්ත, පිලි යෙදීම, හල් කිරීම, අනුස්වාරය, අර්ධ අනුස්වාරය, විසර්ගය, උත්ක්ෂිප්ත ධ්වනි, පද බෙදීම, විරාම ලක්ෂණ පිළිබඳ ව අවබෝධය. (මීට අමතර ව පැරණි ලේඛන සම්ප්‍රදායෙහි එන ලේඛන නීතිරීති පිළිබඳ ව ද සාමාන්‍ය දැනීමක් අපේක්ෂිතයි.) | 10<br><br>(5) |
| | 1.3 හින්දි වර්ණ මාලාව නිවැරදි ව උච්චාරණය කරයි. | **උච්චාරණ විශේෂතා**<br><br>මේ යටතේ පහත දැක්වෙන උච්චාරණ විශේෂතා පිළිබඳ ව නිවැරදි අවබෝධයක් හා හුරුවක් ලබා ගැනීම අපේක්ෂිත ය. මෙහි දී ප්‍රායෝගික ප්‍රාගුණ්‍යය සඳහා වැඩසටහන් සම්පාදනය කළ යුතු වේ.<br>• ˆ i රෑ i ~ i ˆධ යන ස්වර අක්ෂර උච්චාරණයේ විශේෂතා.<br>• ඟ් i ඟ් i ඞ් i ශ් i ය i ) i ඹ යන ව්‍යඤ්ජන අක්ෂර උච්චාරණයේ විශේෂතා.<br>• අනුස්වාරය, අර්ධ අනුස්වාරය හා මහාප්‍රාණ අක්ෂර උච්චාරණය.<br>• ඳු i ථ් i ෲ i ඵු i ජී යන ව්‍යඤ්ජන අක්ෂර උච්චාරණයේ විශේෂතා.<br>• ඵු i ළු යන උත්ක්ෂිප්ත ධ්වනි උච්චාරණයේ විශේෂතා. | (5) |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 2.0 සවන් දී අර්ථය පැහැදිලිව හා නිවැරදිව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | 2.1 ප්‍රශ්න අසයි.<br><br>2.2 අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.<br><br>2.3 සරල උපදෙස් ලබා දෙයි.<br><br>2.4 සංවාදයකට සහභාගී වෙයි. | • භාෂණය.<br><br>පහත දැක්වෙන අවස්ථාවල දී හින්දියෙන් සංවාදයෙහි යෙදීමට හුරු වීම මේ යටතේ අපේක්ෂිතයි.<br><br>• **ආචාර කිරීම** : සමාන පුද්ගලයෙකුට හා තමාට වඩා උසස් පුද්ගලයෙකුට ආචාර කිරීම.<br>• **හඳුනා ගැනීම** : හඳුනා ගැනීම හා හඳුන්වා දීම.<br><br>• **සුබ පැතීම** : උපන් දිනයේ දී, විවාහයේ දී, ජය ලැබීමක දී, පත්වීමක්/තනතුරක් ලැබීමේ දී, උසස්වීමක දී සුභ පැතීම, අවසර ගැනීම, සමාව ගැනීම, ස්තුති කිරීම.<br><br>• **විමසීම** : කොහේ ද, කෙසේ ද, කවදා ද, කුමක් ද, කවුරු ද, කිම (ඇයි) ද, කොපමණ ද යන ප්‍රශ්න ඇසීම.<br><br>• **හැඟීම් ප්‍රකාශය** : සතුට, අසතුට, එකඟතාව, අනුමැතිය, ආදරය, ප්‍රේමය, කරුණාව, දුක, කනගාටුව, කෝපය, වේදනාව යන හැඟීම් පළ කිරීම.<br><br>• **සංචාරයේ දී** : බසයෙන්, දුම්රියෙන්, මෝටර් රියෙන්, ගුවනින්, මුහුදින්, කුලී රියෙන්, පයින් ගමන් යෑමේ දී<br><br>• **මිල දී ගැනීමේ දී** : වෙළෙඳ පොළක දී, සාප්පුවක දී,<br><br>• කාර්යාලයක දී, පාසල, විශ්වවිද්‍යාලය, බැංකුව, පොලිසිය, තැපැල් හල, රෝහල යන ස්ථානවල දී<br><br>• සිද්ධස්ථානයක දී, උත්සව හා සැණකෙළි ආදියෙහි දී විශ්‍රාමශාලාව, තානායම, හෝටලය, සංචාරක හෝටලය යන ස්ථානවල දී<br><br>• දුරකථනයෙන්, මිතුරෙකු සමග, ගුරුතමා සමග, මව්පියන් සමග, භික්ෂූන් වහන්සේ නමක් සමග, පූජකතුමෙකු සමග, නිලධාරියෙකු සමඟ | 88<br><br>46 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 2.5. මාතෘකාවකට අනුව කතා කරයි | • **සරල මාතෘකා යටතේ හින්දියෙන් කථා පැවැත්වීම**<br><br>තමා අවට පරිසරය, සිදුවීම් හා අත්දැකීම් ඇසුරු කොට ගෙන හින්දියෙන් සරල කථා පැවැත්වීම.<br>මෙම ක්ෂේත්‍රය අධ්‍යයනය කිරීමේ දී ඉහත සඳහන් අවස්ථා පන්ති කාමරය තුළත්, ඉන් බැහැරවත් සංවිධානය කොට තනි තනිව හෝ යුගල වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන් හෝ අභ්‍යාස කරවමින් ප්‍රායෝගික කුසලතා ලබා ගැනීමට පහසුකම් සැලසීම අපේක්ෂිත ය. එසේ ශ්‍රවණ හා භාෂණ කෞශල්‍යය ඇගැයීම සඳහා ද මේ අවස්ථා යොදා ගත යුතු ය. | 14 |
| 3.0 කියවා අර්ථය අවබෝධ කර ගනියි. | 3.1 අනිර්දිෂ්ට ගද්‍ය කියවා අවබෝධ කර ගනියි.<br><br>3.2 අනිර්දිෂ්ට පද්‍ය කියවා අබෝධයෙන් කර ගනියි. | • **අර්ථාවබෝධය.**<br><br>**'හින්දී පාඨාවලී'** නිර්දිෂ්ට ග්‍රන්ථයෙහි භාෂා තත්ත්වයට සමාන අනිර්දිෂ්ට ග්‍රන්ථවලින් උපුටා ගත් ගද්‍ය - පද්‍ය කොටස් කියවා අවබෝධ කර ගැනීම හා එම අවබෝධය හින්දියෙන් ප්‍රකාශ කිරීම. | 18 |
| 4.0 (1) මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි. | 4.1.1 වාක්‍ය නිර්මාණය කරයි.<br><br>4.1.2 සරල ඡේද නිර්මාණය කරයි. | • **ව්‍යාකරණය.**<br>**සම්මත හින්දී ව්‍යාකරණය හා භාෂා ප්‍රයෝග**<br><br>• **නාමපදවල ව්‍යාකරණානුකූල භාවිතය** : වචන භේදය, ලිංග භේදය.<br>• **සර්වනාම පදවල ව්‍යාකරණානුකූල භාවිතය**<br>• **විශේෂණ පදවල ව්‍යාකරණානුකූල භාවිතය**<br>• **විභක්ති ප්‍රත්‍ය භාවිතය.**<br>• **සංඛ්‍යාංකනය** : හින්දී අංකන ක්‍රමය හා ජාත්‍යන්තර අංකන ක්‍රමය භාවිත කිරීම.<br>• **ක්‍රියා ප්‍රභේද**: අර්ථ හා ව්‍යුත්පත්ති වශයෙන් ක්‍රියා ප්‍රභේද සහ විධි ක්‍රියා, සහායක ක්‍රියා, සංයුක්ත ක්‍රියා හා ප්‍රේරණාර්ථ ක්‍රියා.<br>• **කාල ප්‍රභේද**: **වර්තමාන** - සාමාන්‍ය, අපූර්ණ, සංදිග්ධ, සම්භාව්‍ය වර්තමානකාල ක්‍රියා **අනාගත** - සාමාන්‍ය, සම්භාව්‍ය, හේතුහේතුමද් අනාගතකාල ක්‍රියා **අතීත** - සාමාන්‍ය, පූර්ණ, අපූර්ණ, සංදිග්ධ, හේතුහේතුමද් අතීතකාල ක්‍රියා | 22<br><br>75<br><br>25 |

13 වන ශ්‍රේණිය

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 4. 0 (2) මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි. | 4.2.1 මූලික ව්‍යාකරණ හා වාක්‍ය නිර්මාණ උගනියි. | • **අව්‍යය ප්‍රභේද** : ක්‍රියා විශේෂණ, සම්බන්ධසූචක, සමුච්චයබෝධක, විස්මයාදිබෝධක අව්‍යය.<br>• **වාච්‍ය** : කර්තෘ, කර්ම, භාව ප්‍රභේද.<br>• **කෘදන්ත** : විකාරී සහ අවිකාරී කෘදන්ත.<br>• **සංඛ්‍යාංකනය** : ගණන සංඛ්‍යා, ක්‍රමවාචී සංඛ්‍යා, ගුණවාචී සංඛ්‍යා, යෝගවාචී සංඛ්‍යා.<br>• **වාක්‍ය නිර්මාණය** : සම්මත හින්දී ව්‍යාකරණ සම්ප්‍රදායට අනුකූල ව අර්ථය නිවැරදි ව හා පැහැදිලි ව ප්‍රකාශ කෙරෙන වාක්‍ය නිර්මාණය. | 45 |
| | 4.2.2 සරල රචනා නිර්මාණය කරයි. | • **රචනා, ලිපි, වාර්තා හා සංවාද**<br>• **රචනා** : දෙන ලද මාතෘකා යටතේ හින්දී අකුරින් රචනා ලිවීම.<br>• **ලිපි** : උපදෙස්වලට අනුව හින්දී අකුරින් පෞද්ගලික ලිපි ලිවීම.<br>• **වාර්තා** : කිසියම් සිද්ධියක්/අවස්ථාවක් සම්බන්ධයෙන් හින්දී අකුරින් වාර්තා ලිවීම.<br>•**සංවාද**: මෙම විෂය නිර්දේශයෙහි ඉහත සඳහන් 'භාෂණය' යටතේ එන සංවාද නිර්මාණය කිරීමට හුරු වීම අවශ්‍ය වේ. දෙනු ලබන උපදෙස් මත හින්දී අකුරින් සංවාද නිර්මාණය කිරීම අපේක්ෂිත ය. | 32 |
| | 4.2.3 සරල සංවාද නිර්මාණය කරයි. | මෙම විෂය නිර්දේශයෙහි **"සරල මාතෘකා අනුව හින්දියෙන් කථා පැවැත්වීම"** යටතේ දැක්වෙන මට්ටමේ විෂය මාතෘකා තෝරා ගැනීම අපේක්ෂිත ය. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 5.0 සරල හින්දී සාහිත්‍යාංග කියවා රසවිඳියි. | 5.1 නිර්දිෂ්ට ගද්‍ය කියවා රසවිඳියි.<br><br>5.2 නිර්දිෂ්ට පද්‍ය කියවා රසවිඳියි.<br><br>5.3 නිර්දිෂ්ට ගද්‍ය-පද්‍යයන්හි සාහිත්‍යයික විශේෂතා හඳුනාගනියි. | • **සාහිත්‍යය රසවිඳීම**<br><br>• **රසවිඳීම : 'හින්දී පාඨාවලී'** *((2009) සංස්කාරක මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.)* නිර්දිෂ්ට ග්‍රන්ථයෙහි ඇතුළත් ගද්‍ය-පද්‍ය පාඨවල සාහිත්‍ය රසය විඳීමට හුරු වීම.<br><br>• **අර්ථාවබෝධය : 'හින්දී පාඨාවලී'** *(2009) සංස්කාරක මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.* නිර්දිෂ්ට ග්‍රන්ථයෙහි ඇතුළත් ගද්‍ය-පද්‍ය පාඨවල අර්ථය අවබෝධ කර ගැනීම. | 18<br><br>18 |
| 6.0 පරිවර්තන හැකියාව වර්ධනය කර ගනියි. | 6.1 හින්දී ගද්‍ය පාඨ සහ සංවාද, සිංහල/ දෙමළ/ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරයි.<br><br>6.2 සිංහල/දෙමළ/ ඉංග්‍රීසි, සරල ගද්‍ය පාඨ සහ සංවාද හින්දී භාෂාවට පරිවර්තනය කරයි. | • **පරිවර්තනය**<br><br>**'හින්දී පාඨාවලී'** නිර්දිෂ්ට ග්‍රන්ථයෙහි ඇතුළත් හින්දී ගද්‍ය-පද්‍ය පාඨ හා ඊට සමාන අනිර්දිෂ්ට ග්‍රන්ථවලින් උපුටා ගත් හින්දී ගද්‍ය-පද්‍ය පාඨ සිංහලට/දෙමළට/ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම.<br><br>(විෂය නිර්දේශයේ මට්ටමට ගැළපෙන) සිංහල/දෙමළ/ඉංග්‍රීසි සරල ගද්‍ය පාඨ හෝ සංවාද හින්දියට පරිවර්තනය කොට හින්දී අකුරින් ලිවීම. | 14<br><br>16 |
| 7.0 නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ මූලික අවබෝධය ලබයි. | 7.1 නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය හඳුනාගනියි.<br><br>7.2 නූතන හින්දී සාහිත්‍යයේ සාහිත්‍යකරුවන් හඳුනාගනියි | • නූතන හින්දී සාහිත්‍යය.<br><br>**'නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය'** *((සංශෝධිත සංස්කරණය) (2009), මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ.)* නිර්දිෂ්ට ග්‍රන්ථයට අදාළ ව නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය හා සාහිත්‍යකරුවන් පිළිබඳ අවබෝධය ලබා ගැනීම. | 10 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 8.0 හින්දී භාෂකයන් සමග භාෂණයේ යෙදීමේ හැකියාව ලබයි. | 8.1 විවිධ සමාජ ස්තරවල හින්දී භාෂකයන් සමග හින්දියෙන් භාෂණයේ යෙදෙයි. | • හින්දී පාඨාවලී’ නිර්දිෂ්ට ග්‍රන්ථය. | 47 |
| 9.0 හින්දී භාෂාව හා සාහිත්‍යය ඇසුරෙන් භාරතීය සංස්කෘතිය හඳුනාගනියි. | 9.1 භාරතීය ආහාරපාන හඳුනාගනියි.<br>9.2 භාරතීය ඇඳුම්-පැළඳුම් හඳුනාගනියි.<br>9.3 භාරතීය ගෘහ- උපකරණ හඳුනාගනියි.<br>9.4 භාරතීය ක්‍රීඩා හා කෙළි සෙල්ලම් හඳුනාගනියි.<br>9.5 භාරතීය පුදපූජා හා ඇදහිලි හඳුනාගනියි.<br>9.6 භාරතීය ආගමික හා සාමාජික උත්සව හඳුනාගනියි. | • හින්දී පාඨාවලී’ නිර්දිෂ්ට ග්‍රන්ථය. | 65 |
| 10.0 හින්දී භාෂා- සාහිත්‍යයෙහි අන්තර්ගත හරධර්ම චරිතායනය කරයි. | 10.1 හින්දී භාෂා- සාහිත්‍යයෙහි අන්තර්ගත හරධර්ම චරිතායනය කොට ක්‍රියාවට නගයි. | • හින්දී පාඨාවලී’ නිර්දිෂ්ට ග්‍රන්ථය. | 35 |

**පරිශීලන ග්‍රන්ථ:**

- 'හින්දී වියරණ හුරුව' (2005, 2008 පළමු සංස්කරණය) ලක්ෂ්මන් සෙනෙවිරත්න, සමයවර්ධන ග්‍රන්ථ ප්‍රකාශකයෝ, කොළඹ 10.
- 'හින්දී ලේඛන හුරුව' (2008) ආචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න, කර්තෘ ප්‍රකාශනයකි.
- 'කථා සරිතා' (භාග් 3, 4), දිවාකර් පාණ්ඩේය, ගෝයල් බ්‍රදර්ස් ප්‍රකාශන්, නව් දිල්ලි.
- 'බාල් හින්දී ව්‍යාකරණ කථා රචනා, ගෝයල් බ්‍රදර්ස් ප්‍රකාශන්, නව් දිල්ලි.

## 4 .0 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය.

4.1 ලේඛනය සහ උච්චාරණය හුරු කිරීම සඳහා

4.1.1 කණ්ඩායම් වශයෙන් වෙන් කොට, උච්චාරණයට අදාළ හඳුනාගැනීමට ඉඩ සැලැස්වීම.

4.1.2 කියවන විට ලිවීම.

4.1.3 ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යයන් ඇසුරෙන් උච්චාරණ විශේෂතා අධ්‍යයනය කිරීමට සැලැස්වීම.

4.1.4 කණ්ඩායම් වශයෙන් හෝ තනිතනිව ම හෝ වචනයට අදාළ රූපයත්, රූපයට අදාළ වචනයත් හඳුනාගැනීමට සැලැස්වීම.

4.2 ව්‍යාකරණය

4.2.1 සෑම ව්‍යාකරණ පාඩමකට ම අදාළ ව විවිධ අභ්‍යාස කරවීම.

4.2.2 කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව ම හෝ ඉගෙනගත් ව්‍යාකරණ පාඩම් සිසුන් ලවා පැහැදිලි කිරීමට සැලැස්වීම.

4.3 සංවාද පුහුණුව

4.3.1 සිසුන්ගෙන් උත්තර බලාපොරොත්තුවෙන් ප්‍රශ්න ඇසීම.

4.3.2 උත්තරයට අදාළ ප්‍රශ්නය සිසුන් ලවා විමසවීම.

4.3.3 ක්ෂණික මාතෘකා යටතේ කෙටි වාක්‍ය නිර්මාණය කිරීම.

4.3.4 පින්තූර පෙන්වා විස්තර ඇසීම.

4.3.5 යුගල වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන් සංවාද පුහුණු කිරීම.

4.3.6 කෙටි නාට්‍ය ආශ්‍රයෙන් සංවාද පුහුණු කිරීමට සැලැස්වීම.

4.4 පන්තිය තුළ ම හින්දී පොතපත කියවීම පුහුණු කිරීම සඳහා පුස්තකාලයක් පවත්වාගෙන යෑම

## 5 .0 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

හින්දී භාෂාව හා නිර්දිෂ්ට ග්‍රන්ථවල එන සාහිත්‍යයික කොටස් හැදෑරීමෙන් පසු එම දැනුම, කුසලතා හා නව ආකල්ප භාවිතයට ගනිමින් පාසලේ විෂය සමගාමී කටයුතු ලෙස පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කළ හැකි වනු ඇත. එනම්,

5.1 'විශ්ව හින්දී දිනය'/'හින්දී භාෂා දිනය' සැමරීම.

5.2 ස්ව නිර්මාණ ද ඇතුළත් 'හින්දී සඟරාව'ක් නිර්මාණය කිරීම.

5.3 ඉන්දීය සංස්කෘතිය විදහා දැක්වෙන හින්දී චිත්‍රපට උළෙලවල් සංවිධානය කිරීම.

5.4 පාසලේ පැවැත්වෙන රැස්වීම්වල දී හින්දී බසින් ප්‍රවෘත්ති, කථා සහ ගීත ආදිය ඉදිරිපත් කිරීම.

5.5 උත්තර භාරතීය සංස්කෘතිය විදහා දැක්වෙන වැඩමුළු, ප්‍රදර්ශන ආදිය පැවැත්වීම.

5.6 පාසල තුළ හෝ අන්තර් පාඨශාලීය මට්ටමින් හෝ හින්දී බසින් රචනා, කථික, ගීත නිර්මාණ, නාට්‍ය ආදි තරග පැවැත්වීම.

5.7 හින්දී භාෂාව පිළිබඳ ව වැඩිදුර දැනුමක් ලබා දීම සඳහා තත් විෂය හා සම්බන්ධ වියතුන්ගේ සහභාගිත්වයෙන් සම්මන්ත්‍රණ පැවැත්වීම.

## 6. 0 තක්සේරු හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මකව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ය.

13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගයීම වන අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය.

මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2011 වර්ෂයේ දී පැවැත්වේ.

මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.